(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(11).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2026 අප්‍රේල් 30 බ්‍රහස්පතින්දා

2026 මැයි 19 අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 1),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.14,500,000,000 සිට රු. 9,000,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.14,500,000,000 සිට රු. 5,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.10,000,000,000 සිට රු. 3,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 2),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 38 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 38 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 2,500,000,000 සිට රු. 800,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,000,000,000 සිට රු. 1,175,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 700,000,000 සිට රු. 375,000,000 දක්වා |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 3),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 39 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 39 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 24702 “අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 8,000,000 සිට රු. 1,500,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 4),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 40 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 40 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 25002 “වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 800,000 සිට රු. 570,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 5),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 41 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 41 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,250,000,000 සිට රු. 1,150,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,250,000,000 සිට රු. 1,150,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 6),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 42 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 42 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,000,000,000 සිට රු. 2,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 7),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 43 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 43 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000 සිට රු. 60,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 8),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 44 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 44 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 31003 "රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම- රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 450,000,000 සිට රු. 325,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 9),— 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියම අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

<u>උපලේඛනය</u>

(අමුණා ඇති උපලේඛනය පරිදි)

## උපලේඛනය

## 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධාන

2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2025 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

**කණ්ඩායම් විධාන අංක 01**

2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතලවලට අනුව අනුර කුමාර දිසානායක වන මම, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය යටතේ මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00801, 01101, 02101, 10201, 11201, 11601, 13501, 14901, 15101, 17101, 18601, 21901, 22801, 23801, 24301, 24401, 24801, 24901, 25601, 25701, 26201, 26301, 26501, 28001, 28101, 28901, 29001, 29201, 29701, 29901, 30001, 30301, 30701, 31101, 33201 සහ 33801 ට අදාළ වන්නාවූ පනතේ තෙවන උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 00801 | - | - | 4,500,000 | 3,900,000 | - | - | 1 |
| 2 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 01101 | - | - | 3,200,000 | 2,800,000 | - | - | 2 |
| 3 | ජාතික විගණන කාර්යාලය | 02101 | - | - | - | - | 200,000,000 | 245,000,000 | 3 |
| 4 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා | 10201 | 20,000,000 | 20,353,000 | - | - | - | - | 4 |
| 5 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා | 11201 | - | - | - | - | 130,000,000 | 170,000,000 | 5 |
| 6 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා | 11601 | - | - | 9,000,000 | 5,000,000 | - | - | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා | 13501 | - | - | - | - | 100,000,000 | 120,000,000 | 7 |
| 8 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා | 14901 | 200,000,000 | 200,600,000 | - | - | - | - | 8 |
| 9 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යවරයා | 15101 | - | - | 8,000,000 | 7,760,000 | - | - | 9 |
| 10 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරයා | 17101 | - | - | 47,000,000 | 40,000,000 | - | - | 10 |
| 11 | ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා | 18601 | - | - | - | - | 3,500,000 | 9,000,000 | 11 |
| 12 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | - | - | 11,000,000 | 10,711,700 | - | - | 12 |
| 13 | අධිකරණ පරිපාලනය | 22801 | 550,000,000 | 550,737,401 | - | - | - | - | 13 |
| 14 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 23801 | - | - | 3,000,000 | 2,500,000 | - | - | 14 |
| 15 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 24301 | - | - | 4,000,000 | 3,750,000 | - | - | 15 |
| 16 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 16 |
| 17 | සුරාබදු දෙපාර්තමේන්තුව | 24801 | - | - | 45,000,000 | 41,000,000 | - | - | 17 |
| 18 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 24901 | - | - | 6,000,000 | 5,000,000 | - | - | 18 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | 150,000,000 | 135,000,000 | - | - | 19 |
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 25701 | - | - | - | - | 350,000,000 | 372,000,000 | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | - | - | 260,000,000 | 360,000,000 | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 26301 | - | - | - | - | 250,000,000 | 275,000,000 | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මන්නාරම | 26501 | - | - | 20,000,000 | 17,500,000 | 80,000,000 | 83,000,000 | 23 |
| 24 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 28001 | - | - | 5,000,000 | 3,700,000 | - | - | 24 |
| 25 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 28101 | 350,000,000 | 351,682,850.41 | - | - | - | - | 25 |
| 26 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28901 | - | - | 45,000,000 | 40,000,000 | - | - | 26 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 29001 | - | - | 25,000,000 | 24,400,000 | - | - | 27 |
| 28 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 29201 | - | - | 25,000,000 | 23,000,000 | - | - | 28 |
| 29 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 29701 | - | - | 6,000,000 | 5,900,000 | - | - | 29 |
| 30 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 29901 | - | - | 4,000,000 | 3,000,000 | - | - | 30 |
| 31 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 30001 | - | - | 4,000,000 | 3,100,000 | - | - | 31 |
| 32 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 5,000,000 | 4,800,000 | - | - | 32 |
| 33 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 30701 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 33 |
| 34 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 31101 | - | - | 9,200,000 | 6,700,000 | - | - | 34 |
| 35 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 33201 | - | - | 12,000,000 | 11,321,006 | - | - | 35 |
| 36 | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | 33801 | - | - | - | - | 4,500,000 | 9,500,000 | 36 |

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මැයි 19 අඟහරුවාදා)**

1972/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂය වනවිට අඩු ආදායම්ලාභී, මධ්‍යම ආදායම්ලාභී, ග්‍රාමීය, වතු සහ ඌන පහසුකම් සහිත නාගරික යන ජන කාණ්ඩ අනුව නිල වශයෙන් තක්සේරු කර ඇති නිවාස හිඟය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2026-2029 කාලය සඳහා නිවාස ලබාදීමේ අපේක්ෂිත ඉලක්කය සහ නිවාස වර්ගය අනුව එක් නිවාස ඒකකයක ඇස්තමේන්තුගත සාමාන්‍ය ඉදිකිරීම් පිරිවැය කවරේද;

(iii) ජාතික මධ්‍ය ගෘහස්ථ ආදායමට අඩු ප්‍රතිලාභීන්ගේ අනුපාතය කවරේද;

(iv) පවතින උකස් පොලී අනුපාත, උද්ධමනය සහ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාම අනුව නිවාස ඒකකයක දැරිය හැකි මිල තක්සේරු කර තිබේද;

(v) ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ වාස්තවික සුදුසුකම් නිර්ණායක සහ ඩිජිටල් සත්‍යාපන පද්ධති කවරේද;

(vi) 2024-2025 කාලය තුළ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ තීරණ අතරින් අක්‍රමිකතා හේතුවෙන් අභියාචනා කරන ලද හෝ සමාලෝචනය කළ හෝ අවලංගු කළ තීරණ සංඛ්‍යාව කොපමණද;

(vii) දේශපාලනීකරණය සහ ද්විගුණවීම වැළැක්වීමට විනිවිදභාවයකින් යුතු ප්‍රසිද්ධ කරන ලද ප්‍රතිලාභී ලේඛනයක් තිබේද;

(viii) මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ix) එසේ නම්, එම ස්ථානය සහ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1973/2026

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015–2022 සහ 2022 සිට මේ දක්වා කාල සීමාවන් සඳහා, එක් එක් වර්ෂය අනුව මුළු සංචාරක පැමිණීම් සහ දළ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල පරිච්ඡේද 02 තුළ එක් එක් වර්ෂය තුළදී සිදුවූ පැමිණීම්, රටවල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015–2022 කාලය තුළ ප්‍රධාන ප්‍රභව වෙළෙඳපොළ 05 කවරේද;

(iv) 2022 සිට මේ දක්වා කාලය තුළ ඉහත වෙළෙඳපොළ වෙනස්වී තිබේද;

(v) 2022න් පසු හඳුනාගත් නව හෝ නැගී එන වෙළෙඳපොළ සහ ඒවායේ වර්ධන ප්‍රතිශත කවරේද;

(vi) ඉහත කාල සීමා සඳහා සංචාරකයෙකු විසින් සිදුකළ වියදමෙහි සහ රැඳී සිටි කාලයේ සාමාන්‍යය කොපමණද;

(vii) ඉහත කාල සීමා සඳහා විදේශයන්හි සිදු කර ඇති සමස්ත ප්‍රවර්ධන වියදම සහ එමගින් ලබාගත් මැනිය හැකි ප්‍රතිඵල කොපමණද;

(viii) කෙටි, මධ්‍ය සහ දීර්ඝ කාලීන වශයෙන් සංචාරක සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලසුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) පසුගිය වසර 05 තුළ සංචාරක අංශයෙන් රජයට උපයාගත් ඇස්තමේන්තුගත බදු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1974/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජනාවාස යෝජනා ක්‍රම ආරම්භයේ සිට අන් සතු කර ඇති ඉඩම් ප්‍රමාණය සහ පැහැදිලි හිමිකම් පත්‍ර නොමැති ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට වාණිජ/කාර්මික භාවිතයට මාරු කර ඇති, බදුදී ඇති හෝ නැවත වෙන් කළ ඉඩම්, ඒ සඳහා භාවිතා කළ නිර්ණායක සහ අනුමැතිය ලබා දුන් අධිකාරිය කවරේද;

(iii) මහවැලි ඉඩම්වල අවිධිමත් අත්පත් කරගැනීම් හෝ ද්විතීයික ගනුදෙනු සිදුවී තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉඩම් ඩිජිටල්කරණය, භූගෝලීය තොරතුරු පද්ධති සිතියම්ගත කිරීම සහ ස්ථිර හිමිකම් ලේඛන නිකුත් කිරීමේ වත්මන් තත්ත්වය කවරේද;

(vi) දිගුකාලීන පදිංචිකරුවන් සම්බන්ධ විධිමත් කිරීම සහ ඉඩම් වෙන් කිරීමේදී විනිවිදභාවය ශක්තිමත් කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ කිරීම රජය විසින් සලකා බලන්නේද;

(vii) කාර්යක්ෂම ආර්ථික ක්‍රියාකාරකම් සඳහා භාවිතා නොකළ ඉඩම්වල ප්‍රමාණය සහ ඒවා පිහිටි ස්ථාන කවරේද;

(viii) පසුගිය වසර 10 තුළ මහවැලි ව්‍යාපෘතියේ ආර්ථික ප්‍රතිලාභය, එක් එක් වසර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2013/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1949 මුදල් නීති පනතින් ස්ථාපිත, පසුව පනත් සහ සංශෝධන මඟින් විශේෂ කාර්යයන් පවරා ක්‍රියාත්මකවූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පැවැත්ම, 2023 මහ බැංකු පනත යටතේද අඛණ්ඩව ක්‍රියාත්මක වන බවත්;

(ii) මහ බැංකු පනතේ XIX කොටස අනුව 2023.09.15 දිනට පෙර මුදල් නීති පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ මුදල් මණ්ඩලයට පැවරුණු අයිතිවාසිකම් සහ බැඳීම්/වගකීම්, මහ බැංකුව පිළිගත යුතු බවත්;

(iii) මුදල් නීති පනත හෝ වෙනත් නීතියක් යටතේ මුදල් මණ්ඩලය ගත්, නිකුත් කළ ක්‍රියාමාර්ග, නියෝග හෝ තීරණ මහ බැංකුව විසින් ගත්/ නිකුත් කළ ලෙස සැලකිය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුදල් මණ්ඩලය විසින් 2023.09.15 දිනට පෙර විශ්‍රාමගන්වන ලද විශ්‍රාමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා කාලීන විශ්‍රාම වැටුප් සංශෝධන ප්‍රතිපත්තියට අදාළ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති තීරණ සහ ආයතනික ප්‍රතිපත්ති, පාලක මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

(ii) නොඑසේ නම්, විශ්‍රාමිකයන් ආවරණය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2014/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පරගොඩ, කිතුලගොඩ කණිෂ්ඨ විද්‍යාලය වසා දැමීමට පියවර ගෙන තිබේද;

(ii) එම පාසල ස්ථාපිත කරන ලද වර්ෂය කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ, එම පාසලේ අධ්‍යාපනය හදාරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාසල වසා දැමීමේදී, එහි අධ්‍යාපනය ලබන සිසුන්ට සහ ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුන්ට වෙනත් පාසල්වලට යාමට ඇති දුර සහ මාර්ග දුෂ්කරතා සලකා බැලීමක් කර තිබේද;

(v) එම පාසලේ සිට ආසන්නම පාසල් වෙත ඇති දුර ප්‍රමාණ කවරේද;

(vi) අධික වැසි සහ ගංවතුර තත්ත්වයන් තුළ පරගොඩ සහ කිතුලගොඩ ප්‍රදේශවල ජනතාවට විකල්ප පාසල් වෙත ගමන් කිරීමේ දුෂ්කරතා පිළිබඳ සලකා බලා තිබේද;

(vii) පාසල සම්බන්ධයෙන් පාසල් සංවර්ධන සමිතියේ, මහා සභාව විසින් ගනු ලැබූ තීරණය කවරේද;

(viii) පාසල නැවත ආරම්භ කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මැයි 20 බදාදා)**

1995/2026

ගරු රවී කරුණානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) 2026.03.20 දින ලංකා සතොස ආයතනය විසින් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 100ක් සඳහා ප්‍රකාශයට පත් කළ මිල අඩු කිරීම් සම්බන්ධව—

(i) පාලිත වෙළඳපොළ අනුපාතවලට අඩුවෙන් විකිණීමට හැකි වන පිරිවැය ව්‍යුහය සහ ප්‍රසම්පාදන මිල ගණන් කවරේද;

(ii) එම අඩු කිරීම් සඳහා භාණ්ඩාගාර සහනාධාර, හරස්-සහනාධාර හෝ සැපයුම්කරු ණය විධිවිධාන මඟින් සහාය ලබාදී තිබේද;

(iii) එම වැඩසටහනෙන් පැන නගින මුළු මූල්‍ය පිරිවැය හෝ අවිනිශ්චිත වගකීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි මිලකරණය හේතුවෙන් පුළුල් සිල්ලර වෙළඳපොළ විකෘති වීම හෝ පෞද්ගලික වෙළඳුන්ට අවාසිදායක තත්ත්වයක් ඇතිවීම වැළැක්වීමට පියවර ගෙන තිබේද;

(ii) මුදල් ප්‍රවාහ තත්ත්වය සහ සැපයුම්කරුවන්ට සහ ණයහිමියන්ට ඇති මුළු හිඟ බැරකම් ඇතුළුව, 2024 සිට මේ දක්වා ලංකා සතොස ආයතනයේ විගණනය කරන ලද ලාභය/අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රියාත්මක වන අලෙවිසැල් සංඛ්‍යාව, ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සහ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත වෙළඳපොළ කොටස, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1996/2026

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 02 තුළ සංචාරක පැමිණීම්, වසරින් වසර සිදුවූ වර්ධනය/ පහත වැටීම ඇතුළත්ව එක් එක් ප්‍රධාන සංචාරක ප්‍රභව වෙළඳපොළවල ප්‍රතිශතයක් ලෙස, රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලය තුළ, අලුතින් එක් කළ, නැවත ස්ථාපිත හෝ නතර කරන ලද, සෘජු සංචාරක ගුවන් ගමනාන්ත සංඛ්‍යාව, එක් එක් ආරම්භක රට සහ ගුවන් සේවය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මැනිය හැකි වර්ධනයක් පෙන්නුම් කර ඇති නව දිගු දුර ගමනාන්ත සහ ඒවායෙන් වාර්තාවූ වර්ධන ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නව වෙළඳපොළවලට ඇතුළුවීමට පහසුකම් සැලසීම සඳහා, සංශෝධනය කරන ලද, පුළුල් කරන ලද හෝ අලුතින් සාකච්ඡා කරන ලද ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) MICE, සුඛෝපභෝගී, සුවතා සහ නෞකා සංචාරක ව්‍යාපාර ඇතුළු ඉහළ ආදායම් ජනනය කරන සංචාරක ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ව්‍යුහගත වෙළඳපොළ පර්යේෂණ සිදු කර තිබේද;

(vi) අලුත් වෙළඳපොළට ප්‍රවේශ වන හෝ සේවාවන් පුළුල් කරන ගුවන් සමාගම් සහ සංචාරක ක්‍රියාකරුවන්ට, දැනට ලබා දෙන මූල්‍ය, නියාමන හෝ අලෙවිකරණ දිරිගැන්වීම්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/2026

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින මුළු හෝටල් කාමර ධාරිතාවය සහ ප්‍රාදේශීය මට්ටමින් සංචාරක නවාතැන් ගැනීමේ අනුපාත කවරේද;

(ii) වර්තමානයේ සංචාරකයින් පැමිණීම වැඩි වෙමින් පවතින ප්‍රධාන රටවල් කවරේද;

(iii) ඉන්දියාව, රුසියාව සහ එක්සත් රාජධානිය වැනි සීමිත වෙළඳපොළ සංඛ්‍යාවක් මත ශ්‍රී ලංකාව තවදුරටත් යැපෙන්නේද;

(iv) ඉහත සඳහන් කළ එක් එක් රටවලින් පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සක්‍රියව ඉලක්ක කර ගනිමින් සිටින නව වෙළඳපොළ (උදා: මැද පෙරදිග, නැගෙනහිර යුරෝපය සහ නැගෙනහිර ආසියාව) කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024-2025 කාලසීමාව තුළ අනුමත කර ඇති නව සංචාරක ආයෝජන සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම කොපමණද;

(ii) වෙළඳපොළ සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීම සඳහා විවිධාංගීකරණ උපායමාර්ගයක් අනුගමනය කර තිබේද;

(iii) රට තුළ අලුතින් එක් කිරීමට සැලසුම් කර ඇති හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(iv) එම හෝටල් ඉදි කිරීමට නියමිත ස්ථාන සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාලරාමු කවරේද;

(v) එම නව සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මැයි 21 බ්‍රහස්පතින්දා)**

2000/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හෝ ඒ ආශ්‍රිත නාගරික පුනර්ජීවන වැඩසටහන් යටතේ, දැනට පදිංචියට ගෙන තිබෙන රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) එවැනි සංකීර්ණවල ස්ථාපනය කර ඇති මුළු සෝපාන සංඛ්‍යාව, දැනට අක්‍රියව පවතින සෝපාන සංඛ්‍යාව සහ 2025 වර්ෂය තුළ, සෝපානයකට අදාළව, සාමාන්‍ය අක්‍රිය කාලය කොපමණද;

(iii) 2024 සහ 2025 වර්ෂ සඳහා වෙන්කරන ලද මුළු නඩත්තු ප්‍රතිපාදන ප්‍රමාණය සහ එක් එක් වර්ෂය තුළ සැබවින්ම භාවිතා කරන ලද මුදල කොපමණද;

(iv) තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා නඩත්තු කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සහ එවැනි කොන්ත්‍රාත්තු කිසිවක් අදාළ කොන්ත්‍රාත්තු කාර්ය ඉටු නොකිරීම හේතුවෙන් අවලංගු කර තිබේද;

(v) 2023 සිට ස්වාධීන ව්‍යුහාත්මක සහ ගිනි ආරක්ෂණ විගණන සිදුකොට තිබේද;

(vi) එසේ නම්, එම තොරතුරු පාර්ලිමේන්තුවෙහි සභාගත කරන්නෙහිද;

(vii) දිගු කාලයක් සෝපාන පද්ධති අක්‍රියව පවතින විට, වැඩිහිටි සහ ආබාධිත පදිංචිකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන හදිසි පියවර කවරේද;

(viii) කිසියම් ගොඩනැගිල්ලක් අනාරක්ෂිත ලෙසට, අර්ධ වශයෙන් අනතුරුදායක ලෙසට හෝ හදිසි ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වන ගොඩනැගිල්ලක් ලෙසට ප්‍රකාශයට පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ජාතික 'වැඩියෙන් භෝග වවමු' හෝ ඒ හා සමාන කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව සහ ඒවා ක්‍රියාත්මක කරන ලද අමාත්‍යාංශ හෝ ආයතනික රාමු කවරේද;

(ii) එම වැඩසටහන් යටතේ පොහොර සහනාධාර, වාරිමාර්ග පහසුකම් පුළුල් කිරීම, බීජ සංවර්ධනය, ව්‍යාප්ති සේවා, අලෙවිකරණය සහ ගබඩා යටිතල පහසුකම් සඳහාද ඇතුළුව වාර්ෂිකව වැය කරන ලද මුළු රාජ්‍ය වියදම කොපමණද;

(iii) එම වැඩසටහන් සම්බන්ධයෙන් ස්වාධීන කාර්ය සාධන විගණන හෝ බලපෑම් තක්සේරු කිරීම් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ඒවායෙහි වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(v) ඉහත කී කාලපරිච්ඡේදය තුළ ගොවියාගේ ලාභදායිත්වය, වගා කරන ලද අක්කර ප්‍රමාණය, හෙක්ටයාරයකට බෝග අස්වැන්න, නිෂ්පාදන පිරිවැය සහ අස්වනු නෙලීමෙන් පසු අස්වනු හානි සම්බන්ධයෙන් නිරීක්ෂණයවූ ප්‍රවණතා කවරේද;

(vi) ආනයන ආදේශනය තිරසර කිරීම සහ දේශීය කෘෂිකර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම අවහිර කිරීමට තුඩුදී ඇති පොහොර ප්‍රතිපත්ති වෙනස්වීම්, වාරිමාර්ග පද්ධතිවල ඌනතා, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම, සැපයුම් දාම අකාර්යක්ෂමතා, වෙළඳපොළ විකෘති කිරීම්, මිලකරණ අවිනිශ්චිතතා හෝ දැරිය හැකි ණය පහසුකම් සඳහා ප්‍රවේශය සීමිත වීම ඇතුළු ව්‍යුහාත්මක සීමාවීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2002/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එහි ආරම්භයේ සිට 2025.12.31 වන දින දක්වා දරන ලද ප්‍රාග්ධන වියදමෙහි මුළු එකතුව, ප්‍රධාන යෝජනා ක්‍රම (A, B, C, D, H, L සහ R) අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහවැලි ව්‍යාපෘතිය ආරම්භ කර පසුව කඩිනම් කරන ලද්දේ කවර ජනාධිපතිවරයෙකුගේ පරිපාලනය යටතේද සහ එලෙස කඩිනම් කිරීම ආරම්භවූ වර්ෂය කවරේද;

(iii) 2020 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ වාරිමාර්ග ගාස්තු, ජල විදුලිය අලෙවිය, ඉඩම් බද්දට දීම සහ අනෙකුත් වාණිජ කටයුතු වලින් ජනනයවී ඇති වාර්ෂික ආදායම් මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මුදල් ඒකක, පොලී අනුපාත සහ ණය කල්පිරීමේ පැතිකඩ සඳහන් කරමින්, මහවැලි ව්‍යාපෘතිවලට අදාළව පවතින හිඟ දේශීය සහ විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(v) වාරිමාර්ග නඩත්තු කටයුතු සඳහා හෙක්ටයාරයකට වැයවන වත්මන් පිරිවැය කවරේද;

(vi) එම පිරිවැය සහ සැබෑ පිරිවැය අයකර ගැනීම අතර සංසන්දනය කවරේද;

(vii) මෑතකදී කිසියම් කාර්ය සාධන හෝ වෝහාරික විගණනයක් පවත්වා තිබේද;

(viii) එසේ නම්, එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මැයි 22 සිකුරාදා)**

2003/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 දෙසැම්බර් 31 වන දින වන විට කොළඹ මහ නගර සභා සීමාව තුළ සහ දිවයින පුරා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර වෙන් කර දෙන ලද මුළු නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ප්‍රතිලාභීන් අතරින් නීත්‍යානුකූලව අත්සන් කර ඇති සහ ලියාපදිංචි කළ හැකි සින්නක්කර ඔප්පු හෝ පැවරුම් සාධනපත්‍ර නිකුත් කරනු ලැබ නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී ප්‍රතිලාභීන් සංඛ්‍යාව, ව්‍යාපෘතිය අනුව සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එවැනි ඔප්පු නිකුත් කරනු ලැබීමෙන් වැළැකී සිටීමට හේතුවී ඇති නිශ්චිත නෛතික, මිනුම් සිතියම්, ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ලියකියවිලි අඩුපාඩු කවරේද;

(v) පසුගිය වසර 03 තුළ කටයුතු සිදු කෙරෙමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව කොපමණද;

(vi) වැඩකටයුතු අවසන් නොකර ගොඩගැසී ඇති ඔප්පු ප්‍රමාණය 2026 වර්ෂය තුළ අවසන් කිරීම සඳහා වන මාසික ඉලක්ක ඇතුළත් කාල නියමයන් සහිත ක්‍රියාකාරී සැලැස්ම කවරේද;

(vii) පුරවැසියන්ට ඔවුන්ගේ ඉඩම් අයිතිවාසිකම් ලබා දීම දීර්ඝ කාලීනව ප්‍රමාදවී තිබීම සම්බන්ධයෙන් කිසියම් නිලධාරියෙකුට හෝ ආයතනයකට වගකීම පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි යෝජනා ක්‍රමය යටතේ ස්ථාපිත මුළු ජල විදුලි ධාරිතාව සහ 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික විදුලි ජනනය කොපමණද;

(ii) එම ජල විදුලි පහසුකම් ඉදිකර, සේවාව ආරම්භ කරන ලද දිනය සහ එම ඉදිකිරීම් අනුමත කළ ජනාධිපතිවරයා කවුරුන්ද;

(iii) වික්ටෝරියා, රන්දෙණිගල සහ කොත්මලේ ඇතුළු ප්‍රධාන ජලාශවල වත්මන් අවසාදිත මට්ටම් සහ එමගින් ජලාශවල රඳවා ගැනීමේ ධාරිතාවට ඇති බලපෑම කවරේද;

(iv) පසුගිය වසර 05 තුළ ජලාශ වේලිවල ආරක්ෂාව සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනස්වන වර්ෂාපතන රටාවන් හමුවේ කෘෂිකාර්මික වාරිමාර්ග, පානීය ජල සැපයුම සහ විදුලි ජනනය අතර සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වාරිමාර්ග පද්ධතිය මත තැබිය හැකි විශ්වාසය සහ ගංවතුර කළමනාකරණ හැකියාව පිළිබඳව දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමක් සිදු කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ජුනි 09 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1883/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන රාජ්‍ය අධ්‍යාපන ආයතන කවරේද;

(ii) එම උපාධිය පිරිනමන රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන කවරේද;

(iii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධිය ගුරු සේවයට බඳවාගැනීමේදී සමානව සලකන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

(v) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා කාලය හා අන්තර්ගතය සමාන වන්නේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

(vii) අදාළ ආයතන මඟින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුවක් අනිවාර්ය වන්නේද;

(viii) එසේ නම්, එම කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1885/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතිවු, සායින්දමරුදු සහ කල්මුණේ වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය ජලාශ අතිරේක පෝෂක හේතුවෙන් දූෂණයට ලක්ව ඇති අතර විවිධ වර්ගයේ ජලජ වල් පැලෑටි මඟින් ආක්‍රමණයට ලක්ව වැසී ගොස් ඇති බවත්;

(ii) අධික ලෙස රොන්මඩ තැන්පත් වීමෙන් එම ජලාශවල ගැඹුර අඩුවී ඇති බවත්;

(iii) ඉහත තත්ත්ව හේතුවෙන් එම ජලාශවල ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු වීමෙන් වර්ෂා කාලයේදී ගංවතුර ආපදා වැඩිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල පරිසර හානි සහ ජලාශවල රොන්මඩ තැන්පත් වීම සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදු කර තිබේද;

(ii) රොන්මඩ හා ආක්‍රමණශීලී වල් පැලෑටි ඉවත් කිරීම සහ එම ජලජ පරිසර පද්ධති තිරසර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, ඉහත ප්‍රදේශවල එවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1919/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, එදිරිසිංහ පාර, ගංගොඩවිල ප්‍රදේශයේ පදිංචි අනවසර පවුල් එම ප්‍රදේශයෙන් ඉවත් කර වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා කටයුතු යොදා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල්වලින් නිවාස හිමිවන සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල් සඳහා කොළඹගේ මාවත හෝ කාලිංග මාවත ප්‍රදේශවල නිවාස ලබා නොදී මාලිගාවත්ත ප්‍රදේශයෙන් නිවාස ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්නේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1924/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ විදේශගත ශ්‍රමික පවුල්වලට අයත් පාසල් යන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වන්නේද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ සේවා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එකී නිලධාරීන් විසින් වාර්තා කර ඇති ආකාරයට වයස අවුරුදු 2-5, 6-10 සහ 11-18 දරන කාණ්ඩවල පාසල් දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2025 වර්ෂය සඳහා ලබාදී ඇති පාසල් උපකරණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබා දෙන දත්ත මත ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉහත අ(iv)හි සඳහන් නිලධාරින්ට ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) පාසල් උපකරණ ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පවතින නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1926/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'ඇජ්තොප් වත්ත' රජයේ ඉඩමක් බව පිළිගන්නේද;

(ii) එම ඉඩම අතීතයේ සිට මේ දක්වා පවරා ඇති ආකාරය කවරේද;

(iii) එම ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට මෙම ඉඩමේ පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම පදිංචිකරුවන් විසින් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(vi) පදිංචිවී නොමැති, වගා කටයුතු පමණක් සිදු කරන සංඛ්‍යාව කොපමණද;

(vii) ඔවුන් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(viii) ඉහත ඉඩමේ දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ඉඩම තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් හඳුනාගෙන ඇති අවදානම් කලාප පිහිටා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1931/2026

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළමනාකරණය සඳහා පෞද්ගලික සමාගම්වලට බදුදී ඇති, රජය සතු හෝ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ ඇති මුළු වැවිලි වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෞද්ගලික සමාගම්වල නම් සහ බදුදී ඇති වැවිලි වතුවල නම් කවරේද;

(iii) බදුදී ඇති එම එක් එක් වතුයායෙහි බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වතුයායෙහි සේවය කරන මුළු සේවක සංඛ්‍යාව සේවක කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග, කර්මාන්තශාලා සහ ලයින් කාමර ඇතුළුව ඉහත එක් එක් වතුවලට අයත් මුළු ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඇති වතුවලට අයත් මුළු වැවිලි ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) පසුගිය මූල්‍ය වර්ෂ පහ (05) තුළ එම එක් එක් පෞද්ගලික සමාගම විසින් ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තිබේද;

(iv) එසේ නම්, එම මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1938/2026

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 වර්ෂයේ සිට මේ දක්වා වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම කලින් කලට සිදු කර ඇති ආකාරය කවරේද;

(ii) දැනට ස්ථිර සේවයේ සහ තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 අයවැයෙන් වැඩි කළ වතු කම්කරු වැටුපට හිමිකම් ඇති වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් වැඩි කිරීමෙන් පසු මේ දක්වා එම පිරිසට ගෙවා ඇති මුදල කොපමණද;

(v) වැඩි කළ වතු කම්කරු වැටුප තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන්ට ලබාදීමට කටයුතු කර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1992/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒකාබද්ධ සේවා ගණයට අයත් වන සේවා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවාවල නම් කවරේද;

(iii) මේ වනවිට එම සේවාවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක වීමට ඒකාබද්ධ සේවාවල පවතින පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධව වත්මන් රජය මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2022/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්වූ වතු ආශ්‍රිත පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වතු ආශ්‍රිතව පූර්ණ හානියට සහ අර්ධ හානියට ලක්වූ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) මේ වනවිට වතු ආශ්‍රිතව ඉදිකිරීමට යෝජිත නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2039/2026

ගරු වරුණ ලියනගේ මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමුපකාර ග්‍රාමීය බැංකු රන් භාණ්ඩ උකස් ගනුදෙනු සම්බන්ධයෙන්වූ බලපත්‍රය මහජන බැංකුව සතුව තිබූ බව දන්නේද;

(ii) 2026 වර්ෂයේ සිට එම බලපත්‍රය අවලංගු කර ඇති බව දන්නේද;

(iii) ඉන් පසුව එම බලපත්‍රය ප්‍රාදේශීය ලේකම් යටතට පවරා තිබේද;

(iv) ඒ හේතුවෙන් සමුපකාර සමිතිවලට විවිධ ගැටලුවලට මුහුණදීමට සිදුව ඇති බව දන්නේද;

(v) එම බලපත්‍රය නැවත වරක් මහජන බැංකුව වෙත හෝ සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමයට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

**2026 ජුනි 10 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අතරමගදී පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ළමුන් අයත් වන වයස් කාණ්ඩ කවරේද;

(iii) එම ළමුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ළමුන් පාසල් හැරයාමට බලපා ඇති පොදු හේතු කවරේද;

(v) ඒ සඳහා රජය මඟින් ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් විධිමත් අධ්‍යයනයක් සිදුකරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් කඩිනමින් සිදු කළ යුතු බව පිළිගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1976/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධ සහිත තැනැත්තන් සඳහා ලබාදෙන මාසික ජීවනාධාර මුදල කොපමණද;

(ii) මාසිකව ආබාධිත දීමනාව ලබන ආබාධිත තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දීමනාව සඳහා අලුතින් ඉල්ලුම් කළ හැකි ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) පවුලක ආබාධ සහිත පුද්ගලයන් කිහිපදෙනෙක් සිටින විට, ඉන් ජීවනාධාරය ලබාගැනීමේ හැකියාව ඇති පුද්ගලයන් ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාසික ජීවනාධාර ලබාදීමේදී සුදුස්සන් තෝරා ගැනීම සඳහා භාවිතා කරනු ලබන නිර්ණායක කවරේද;

(ii) ඒ සඳහා අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මට්ටම නිශ්චය කරන ක්‍රමවේදය කවරේද;

(iii) අස්වැසුම හෝ වෙනත් ජීවනාධාරයක් ලබන ආබාධ සහිත තැනැත්තෙකුට ආබාධිත දීමනාව ලබා ගැනීමට බාධාවක් තිබේද;

(iv) 2026 අයවැය මඟින් ආබාධිත දීමනාව ගෙවීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(v) ආබාධිත දීමනාව අපේක්ෂිත පුද්ගලයන් පොරොත්තු ලේඛනයක රැඳී සිටීමට සිදුවන්නේද;

(vi) මාසයේ නිශ්චිත දිනයක දිවයින පුරා ආබාධිත දීමනාව ගෙවීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කිරීමේ හැකියාව තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1989/2026

ගරු චන්දන තෙන්නකෝන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි ගහනය කොපමණද;

(ii) අවසන් වරට සිදු කළ වන අලි සංගණනය අනුව අලි ගහනයේ වර්ධනයක් සිදුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි මිනිස් ගැටුම් වාර්තා වන දිස්ත්‍රික්ක කවරේද;

(ii) අලි මිනිස් ගැටුම හේතුවෙන් 2025 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිදුවී ඇති වන අලි මරණ සංඛ්‍යාව සහ මරණයට පත්වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගල්ගමුව, ඇහැටුවැව, අඹන්පොල සහ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන අලි හැසිරීම්වල සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ලක්ෂණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2036/2026

ගරු සුජීව දිසානායක මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හලාවත වැවිලි සමාගම විසින් පසුගිය වසර 20ක කාලය තුළ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ණය මුදල් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම රාජ්‍ය ආයතන කවරේද;

(iii) එම ණය මුදල් ලබාදී ඇති පදනම කවරේද;

(iv) එම ආයතන සඳහා ලබාදී තිබෙන ණය මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025.12.31 දින වනවිට එම ආයතනවලින් අය කරගෙන ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) හිඟ ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම හිඟ ණය මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/2026

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරෝනා වසංගත සමයේ වැලිකන්ද මූලික රෝහලට සහ පොළොන්නරුව මහ රෝහලට පරිත්‍යාගශීලීන් විසින් වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ පරිත්‍යාග ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම පරිත්‍යාගශීලීන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එසේ ලබාදුන් උපකරණ පිළිබඳ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එම උපකරණ සහ ඒවායේ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම උපකරණ රෝහල් ඉන්වෙන්ට්‍රියට (බඩු වට්ටෝරු පොත) ඇතුළත් කර තිබේද;

(vi) එසේ නම්, ඒවාට අදාළ ඉන්වෙන්ට්‍රි අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii)හි සඳහන් උපකරණ වෙනත් රෝහල් වෙත ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම රෝහල් සහ ලබා දුන් උපකරණ හා ඒවායේ ප්‍රමාණ කවරේද;

(iii) පරිත්‍යාග ලෙස ලැබුණු උපකරණ ප්‍රමාණය සහ මේ වනවිට පවතින උපකරණ ප්‍රමාණය අතර ඌනතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) ඉහත අ(i)හි සඳහන් රෝහල්වල එම කාලසීමාව තුළ සේවයේ යෙදී සිටි වෛද්‍ය අධ්‍යක්ෂකවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ජුනි 11 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

122/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ දක්වා හිමිවී තිබූ නිල වරප්‍රසාද කවරේද;

(ii) එම වරප්‍රසාද කප්පාදු කරන්නේද; නොඑසේ නම්, ඉවත් කරන්නේද;

(iii) එසේ නම්, කප්පාදු කරනු ලබන/ඉවත් කරනු ලබන වරප්‍රසාද කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදී ඇති වරප්‍රසාද සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ කවරේද;

(ii) ඊට අදාළ වාර්තා සභාගත කරන්නේද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල වාහනයක් ලබා දීම සහ ඔවුන්ට පාර්ලිමේන්තු භෝජනාගාරයෙන් ආහාර පාන ලබා දීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

209/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝයර් (Boer) වර්ගයේ එළුවන් 250ක් අභිජනනය කර ක්ෂේත්‍රගත කිරීමේ පස් අවුරුදු ව්‍යාපෘතිය, මාතලේ, ඉඹුල්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ වාර්ෂිකව අභිජනනය කිරීමට අපේක්ෂා කරන ලද එළුවන් සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන්ම අභිජනනය කරන ලද එළුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ආදායම සහ වියදම අනුව එක් එළුවෙකු වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

231/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එක් එක් පළාතේ පළාත්බද නීතිපති දෙපාර්තමේන්තු කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීම සඳහා මේ වනවිට ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

466/2025

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදායම සහ ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ දක්වා එම සංස්ථාවේ වෙළඳපොළ කොටසෙහි ප්‍රතිශතය සහ මුළු ශේෂ පත්‍රයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සංස්ථාවේ තරඟකරුවන්ගේ නම් සහ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වෙළඳපොළ කොටසෙහි ප්‍රතිශතය සහ සමස්තය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා සංස්ථාව විසින් වාර්ෂිකව ගෙවන ලද සෘජු හා වක්‍ර බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සංස්ථාවේ පරිපාලිත සමාගම්වල නම් සහ ඒවා සතු කොටස් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ඉහත සංස්ථාවේ —

(i) සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව සහ ඔවුන්ගේ වැටුප් හා වේතන සඳහා වැයවූ මුළු මුදල;

(ii) ආයෝජන ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

598/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 ජනාධිපතිවරණයෙන් පසුව මේ දක්වා කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් හැර රජය විසින් ලබාගෙන ඇති සම්පූර්ණ ණය මුදල කොපමණද;

(ii) එම ණය ලබාගෙන ඇති රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් රටෙන් ලබාගෙන ඇති ණය මුදල සහ අදාළ පොලී ප්‍රතිශතය;

(ii) ණය මුදල් ලබාගැනීමට අදාළ හේතු;

(iii) ණය වාරික ගෙවීම ආරම්භ වන දිනය සහ ගෙවා අවසන් කිරීමට නියමිත දින;

ණය ලබා ගත් එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

644/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝවල නම් කවරේද;

(ii) මේ වනවිට එම ඩිපෝවල මානව සම්පත් හිඟයක් තිබෙන බව දන්නෙහිද;

(iii) එසේ නම්, එම ඩිපෝවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

655/2025

ගරු රෝහණ බණ්ඩාර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ගබඩාවේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ගබඩා අතරින් 2020 වර්ෂයෙන් පසු නවීකරණය කරන ලද ගබඩා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම නවීකරණ කටයුතු සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vi) එම ගබඩා නවීකරණය කිරීමේ අරමුණු කවරේද;

(vii) එම නවීකරණ කටයුතු පිළිබඳව විගණන වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1106/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.10.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල මුළු වටිනාකම ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

(ii) ඊට අදාළ ආයෝජන ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ ස්වභාවය සහ ආයෝජනය කර ඇති මුදල ඇමරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය/ ආරම්භ කරනු ලබන දිනය, අවසන් වන දිනය සහ එක් එක් ව්‍යාපෘතියෙන් උත්පාදනය කරනු ලබන රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

1472/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාට ලද පැමිණිල්ලකට අනුව නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයාට එරෙහිව 2025.06.04 දින සිට 2025.07.04 දින දක්වා විමර්ශනයක් සිදු කරන ලද බව දන්නේද;

(ii) විමර්ශනය සිදු කරන ලද කමිටුව විසින් එම විමර්ශනය අපක්ෂපාතීව නිසි ආකාරයෙන් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම විමර්ශන කමිටුව විසින් ඉහත විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සිදු කර ඇති නිර්දේශ කවරේද;

(iv) මේ වනවිට, එම නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1950/2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මයිලවට්ටුවාන් ප්‍රදේශයේ ඇති කිරාන්පුල් වැව් බැම්ම, ස්ථිර බැම්මක් ලෙස ඉදිකිරීමට 2016 වර්ෂයේදී එවකට කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් මුල්ගල් තබා ඇති නමුත් මේ දක්වා ඊට අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

(ii) එම ස්ථිර බැම්ම ඉදිකිරීමෙන් අක්කර 8000කට අධික කුඹුරු ඉඩම්වලට ප්‍රතිලාභ ලැබෙන අතර ඉලුක්කුප්පොතාන, ඊරළකුලම, පාලමීන්මඩු සහ මයිලවට්ටුවාන් වැනි ගම්මානවලට ගොඩබිම හරහා ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම බැම්ම ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජුනි 12 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

748/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්රථ ධාවනය සඳහා ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය මුල්වරට යෝජනා කරනු ලැබූ දිනය කවරේද;

(ii) මේ වනවිට එම ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය ක්‍රියාත්මක වන මාර්ග සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය ක්‍රියාත්මක වන මාර්ගවල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවලට අවාසි සහගත තත්ත්වයක් උද්ගතවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමය නැවත සමාලෝචනය කර එකී මාර්ගවල ධාවනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද සාධාරණ අවස්ථා ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

814/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකිරීම් ආරම්භ කරන ලද අධිකරණ සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකරන ලද/ඉදිකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඉහත අධිකරණ සංකීර්ණ අතරින් මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති සංඛ්‍යාව සහ ඉදිකිරීම් අතරමඟ නවතා ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිකිරීම් අතරමඟ නවතා ඇති අධිකරණ සංකීර්ණය කඩිනමින් ඉදිකර අවසන් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

843/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම නගර සභා බලප්‍රදේශයට අයත් ඉඩමක් පසුගිය කාලයේ කුරුලු උයනක් ඉදිකිරීමේ ව්‍යාපෘතියකට ලබා දුන් බව දන්නේද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) එම ඉඩම ලබාගත් සමාගමේ/සමාගම්වල නම/නම් කවරේද;

(iv) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය නතරවී ඇති බව දන්නේද;

(v) මේ හේතුවෙන් සිදුවන විශාල පරිසර හානිය සහ ඉඩම් ගොඩකිරීම වැනි අනවසර කටයුතු වැළැක්වීමටත් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

883/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deeds of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permits) ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරලේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1015/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන ලුහුබැඳීම, හිරිහැර, බියවද්දා මුදල් බලෙන් ලබා ගැනීම, අනන්‍යතා තොරතුරු සොරකම් කිරීම, එකඟතාවයකින් තොරව සංවේදී පෞද්ගලික කරුණු පළ කිරීම සහ කෘත්‍රිම බුද්ධිය අවභාවිතා කිරීම වැනි නිශ්චිත කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති, කාන්තාවන් සම්බන්ධ පරිගණක අපරාධ පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර තුන තුළ එවැනි වැරදි ක්‍රියාවල වැඩිවීමක් කිසියම් නිශ්චිත කාණ්ඩයකට අදාළව සිදුවී තිබේද;

(iii) එසේ නම්, හඳුනාගෙන ඇති මතු වෙමින් පවතින ප්‍රවණතා කවරේද;

(iv) එවැනි වැරදි ක්‍රියා, කාණ්ඩය සහ කලාපය අනුව වර්ගීකරණය කර හඳුනා ගැනීම සඳහා වෙන් වූ දත්ත රැස් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, ලග්ගල ඩිපෝව ඉදිකිරීම සඳහා මුල් ගල තබන ලද දිනය කවරේද;

(ii) එම ඩිපෝව ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ඩිපෝව සතු බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම ඩිපෝ භූමිය වල් බිහිවෙමින් තිබෙන බව දන්නේද;

(v) එම ඩිපෝව යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1244/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති වනජීවී කලාප එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් වනජීවී කලාපයට අයත් භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වනජීවී කලාප තුළ වනජීවීන් වෙනුවෙන් ඇති වැව්, අමුණු සහ විල් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත වනජීවී කලාප තුළ මේ වනවිට ප්‍රතිසංස්කරණය කර හෝ ඉදිකර ඇති වැව්, අමුණු සහ විල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විද්‍යාත්මකව හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(ii) ඒවා ගැසට් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ගැසට් කර ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(iv) හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ මේ වනතෙක් ගැසට් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1373/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපනවේදී උපාධිය ප්‍රදානය කරනු ලබන රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව, පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2025.01.01 වැනි දින සිට මේ දක්වා එම එක් එක් විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර රජයේ ගුරු සේවයට බඳවාගනු ලැබූ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පෞද්ගලික විශ්වවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන අධ්‍යාපනවේදී උපාධියේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සමාජ කතිකාවක් ගොඩනැගී තිබෙන බව දන්නේද;

(iv) පෞද්ගලික විශ්වවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන අධ්‍යාපනවේදී උපාධිය සහ සෙසු උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගංවතුර සහ නායයෑම් ආපදා තත්ත්වයෙන් මාතර දිස්ත්‍රික්කයේ තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයට සහ දෙනියාය මධ්‍ය මහා විද්‍යාලයට ඇතිවූ බලපෑම පිළිබඳව නිශ්චිත වාර්තා ලැබී තිබේද;

(ii) එම ගංවතුර සහ නායයෑම් හේතුවෙන් අධ්‍යාපන කටයුතුවලට ඇතිවූ බාධා කවරේද;

(iii) මෙම තත්ත්වයන් නිරාකරණය කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රතිපාදන එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් මුදල් වෙන්කර වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘතිවලට මේ යටතේ මුදල් වෙන් කර ඇති බව හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙතෙක් අවසන් කර නොමැති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කර නිම කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1934/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ පාලනය වන ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරායන්හි ධීවර කර්මාන්තයට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර තිබේද;

(iii) එම වරායන්හි බෝට්ටු අලුත්වැඩියා කිරීමේදී ඉවතලන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) වරායන් ආශ්‍රිතව ගොඩගසන වැලි ඉවත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) පසුගිය පාලන කාලය තුළ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අභිලාෂ හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවී තිබේද;

(vii) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(viii) ධීවර වරායන් සංවර්ධනය කර ධීවර ජනතාවට පහසුකම් ලබාදීමට වැඩපිළිවෙළක් තිබේද;

(ix) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?